## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

## හා

## අභ්‍යාස ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2016

මැණික් හා ස්වර්ණාභරණ
පර්යේෂණහාඅභ්‍යාසආයතනය

“ඩිල්කෝ කෝට්” ගොඩනැගිල්ල
නව නුවර පාර,
මාලඹේ.
2018.03.20

ලේකම්තුමා
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
සම්පත්පාය,
අංක ,82රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

**<u>වාර්ෂික වාර්තාව 2016</u>**

1971 අංක (2)14 38උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2016 වර්ෂය සඳහා වූ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තා
2. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආයතනයේ ආදායම් හා වියදම් වාර්තාව, 2016 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහප්‍රකාශය
3. 2016 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී

නවරත්න බණ්ඩාර අලහකෝන්
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

# දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

## දැක්ම

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම"

## මෙහෙවර

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පිය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි "

## අභිමතාර්ථ

" ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණය කර තිරසාර ලෙස නෙලා ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම"

**2.** <u>අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය</u>

**.21**201 6 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| 01 | නවරත්න බණ්ඩාර අලහකෝන් මහතා | 2015.02.24 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල සභාපති |
| 02 | කේ.ඩී.ආර් ඔල්ගා මහත්මිය | 2015-03-18 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 03 | ඩී.එම්.ඩී.ඕ.කේ දිසානායක මහතා | 2015-02-20 දින සිට 2017-06-05 දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 04 | එම්.පී.එන්.එම් වික්‍රමසිංහහ මහතා | 2015-06-25දින සිට2017-03-30 දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 05 | එම්.ඒ.එස්.පී.කේ මලවිආරච්චි මහතා | 2016-11ශ01දින සිට2017-10-27 දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

**2.2 ඉහළ කළමණාකාරීත්වය**

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් - ආචාර්ය ප්‍රශාන් ෆ්‍රැන්සිස් මහතා

( B.Sc.Special (Geo., SL) M.Sc. (Gem.,SL) M.Sc. (Petro.,Canada), Ph.D. (Gem.,SL), Dip. Mkt(UK), G.G.(GIA,USA),A.J.P. (GIA,USA), MGA(SL))

**3.** **සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමා ගේ සමාලෝචනය**

**3. 1**අවස්ථා

- **පර්යේෂණ සහ පුහුණු සඳහා ඉල්ලුම වැඩි කිරීම.**

  ආයතනයේ සේවාවන් සඳහා දේශීය හා විදේශීය ඉල්ලුම් වර්ධනය වෙමින් තිබේ .මෙම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා හොඳ ඉල්ලුමක් පැවතීම මෙම ඉල්ලුම වර්ධනය කිරීමට හේතු වී ඇත . මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවාවන් වල ගුණාත්මක තත්වය ඉහල නැංවීමට ගත් ක්‍රියාමාර්ග හරහාද මෙම සේවාවන් වල ඉල්ලුම වැඩි වීමට හේතු වී ඇත .මෙම ක්ෂේත්‍රයට අදාලව සම්පූර්ණ පරාසය තුල පුහුණු සේවාවන් ලබා දෙන වෙනත් කිසිදු ආයතනයක් නොමැත .එසේම මෙම කර්මාන්තයට අවශ්‍ය පර්යේෂණ අවශ්‍යතා සපුරාගෙන සේවා සපයන්නෙකු ද කලාපය තුල නොමැත .එසේම දැනට සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගනිමින් තිබෙන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල පුහුණු වෙළඳපොළ අවශ්‍යතාවයන් සැපිරීමද සිදුකිරීමේ අවකාශය ඇත .

- **සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා**

  ක්ෂේත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත .මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේශණ ,ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම ,ප්‍රාථමික මැණික් නිධි ලබා ගැනීමේ තාක්ෂණය සැලසුම් කිරීම හා සැකසීම ,සහ පරිසණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝසතර නිර්මාණ සහ නිෂ්පාදනය වෙනුවෙන් පුහුණුව ලබා දීම වෙනුවෙන්ද ඇතුලත් වේ.

- **තාක්ෂණික අභිවර්ධනය**

  මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත .

- **ආයතනයේ දියුණුව**

  ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභීන් සඳහා සේවය ලබා දීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ විශ්ව විද්‍යාලයක් මට්ටමට මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යතාවය ද ඇත.

- **වෙනත් පහසුකම්**

  ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් මඟින්ද මෙම ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අසමසම මට්ටමක ආයතනය පවතී.

- **කර්මාන්තයේ දියුණුව සඳහා සංධීය වැඩසටහන්**

  පරිසර අධිකාරීන් සමග මැණික් කර්මාන්තය සඳහා පරිසර හිතකාමී ක්‍රම සඳහා අනුබල දීමද ,ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පර්යේෂණ ව්‍යාපෘති සඳහා ද ,වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහාද සහ සම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත .

- **ප්‍රචාරක වැඩසටහන්**

  ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම කල යුතුව ඇත .මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ,මැණික් හා ස්වර්ණාභරණ සඟරා සහ පුවත් පත්‍රිකා ,ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය යොදා ගත හැක.

**3. 2අභියෝග**

- **යටිතල පහසුකම්**

  පුහුණු ඒකක වල ප්‍රමාණවත්ව නවීන පහසුකම් හා යන්ත්‍ර උපකරණ සංවර්ධනය වී නොමැත .එවැනි උපකරණ මෙම පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට අවශ්‍ය පුහුණුවල දැනුම හා කුසලතාවය ලබා දීමට කඩිනම් පියවර ගත යුතු වේ .ස්වර්ණාභරණ පුහුණු ඒකක වල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍ර උපකරණ හඳුන්වා දිය යුතු වේ .තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත . දියමන්ති කැපීම මෙම කර්මාන්තයේ සුවිශේෂී කර්මාන්තයක් වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබා දීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා පියවර ගත යුතුවේ .

- **භෞතික සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන හා උපකරණ වල හිඟකමක් දක්නට ඇත .තවද වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි පර්යේෂණාගාර පහසුකම්ද වැඩි දියුණු කිරීමට අවශ්‍යව ඇත.

- **සේවකයන්ගේ දුරුවල ආකල්ප**

  මෑත අතීතයේ සේවකයින් තුල සෘණාත්මක ආකල්පමය මානසික පසු බිමක සිටීම.

- **සහෝදර ආයතන මඟින් අපගේ සේවාවන්ම සිදු කිරීම.**

  උදාහරණ:- අපගේ පුහුණු ,රසායනාගාර සේවා ආදිය.

- **මානව සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිත වීම නිසා සහ මෙම ක්ෂේත්‍ර යේ විෂය දැනුම සහිතව සිටින නිළධාරීන් සීමිත වීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීමට ඇති අවස්ථාවන් අවම වීම නිසා අප කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුම සැපරීමට ප්‍රමාණවත් නොවන බව පෙනීයයි .එය කර්මාන්තයේ අනාගතයට හිතකර නොවන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම පහලයාමට බලපෑ හැකිය . ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා හැකිතාක් දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමෙන් මෙම තත්වය සඳහා විසඳුම් ලබා ගත හැකි වේ.

- **මූල්‍ය සම්පත්**

  වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරනාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් දායකත්වයක් මහාභාණ්ඩාගාරය වෙතින් ලැබේ.

- **පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම**

  මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍ර යේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත .

- **කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම**

  උදාහරණ -සේවා කැපුම් අංශය

- **භූ විද්‍යායන්ගේ හා පුහුණු විශේඥයන්ගේ හිඟකම**

- **පර්යේෂකයින්ට සහ පුහුණු කරුවන්ට උසස් පුහුණු කටයුතු සඳහා අවස්ථාවන් නොමැතිකම සහ අධ්‍යක්ෂ ජනරාල් ,පර්යේෂණ හා පුහුණු සහ අනෙකුත් ආධාරක කාර්යය මණ්ඩලය අතර සේවක පරතරයක් පැවතීම**

**4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව**

**4. 1අරමුණු**

25 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පාර්ලිමේන්තු පනතේ 50 අංක 1993(1) වගන්ති ප්‍රකාරව ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ හා පර්යේෂණ හා 882 දිනැති හා අංක 28 ජුලි 1995 ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සහ පු .අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබියහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීම වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීමයි.

**4.ආයතනයේ බලතල 2**

.දරණ ගැසට් පත්‍රය මගින් ආයතනයට පවරා ඇති බලතල පහත දැක්වේ 882 දිනැති අංක 28 ජුලි 1995

(i) ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ හා එම නිධි පිලිබඳව සමීක්ෂණය කිරිම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරිම.

i. එවායේ පිහිටිම
ii. හඳුනා ගැනීම
iii. මැණික් ගල් අනර්ගීකරණය කරන ක්‍රම
iv. ආයතනයට සම්බන්ධ වෙනත් ක්ෂේත්‍ර වල කටයුතු

(ii) පතල් කැපීම් ,මැණික් කැපීම, ස්වර්ණාභරණ නිෂ්පාදනය සහ මැණික් පිරියම් ක්‍රම යන අංශ වලට අදාලව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සංවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලු තාක්ෂණික හා අනෙකුත් උපදෙස් ලබාදීම.

(iii) පහත සඳහන් පුහුණුව ලබාදීම

i. මැණික් කැපීම
ii. ස්වර්ණාභරණ නිෂ්පාදනය
iii. දියමන්ති ඇතුළු රත්න විද්‍යාව
iv. ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය
v. මැණික් ගල් අනර්ගීකරණය හා ගෙවුඩ තාපකරණය ඇතුළුව
vi. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත වලට සම්බන්ධ අනෙකුත් අංශ

**4.3 ක්‍රියාකාරකම් හා කාර්යක්ෂමතාවය**

**4.3. 1**පුහුණු පාඨමාලා දිවයිනේ ප්‍රචලිත කිරීම සඳහා පියවර ගෙන තිබු අතර තරුණ තරුණියන් අඛණ්ඩව පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත.

වර්ෂය තුළදී ආයතනය මගින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා අනුව සැකසුනු ක්ෂේත්‍රය ආශ්‍රිත පාඨමාලාවන් රැසක් පවත්වන ලදිපුහුණු ලාභින්ගේ තාක්ෂණික දැනුම සහ කුසලතා . සංවර්ධනය අරමුණු කරගත් මෙම පුහුණු පාඨමාලාවන් සඳහා අනෙකුත් වර්ෂවලට සාපේක්ෂව වැඩි පුහුණු ලාභින් පිරිසක්සහභාගි විය.

ගෙවී ගිය වර්ෂයේදී ආයතනය මගින් කර්මාන්තයේ ඉල්ලුමක් සහිත පාඨමාලා රැසක් මෙයෙවීමට පියවර ගනු ලැබිණමේ මගින් සත්‍ය වශයෙන්ම කර්මාන්තයේ නියැලෙන පුහුණු ශිල්පීන් බොහොමයකට උසස් . සහජ කුසලතා වලින් පිරිපුන .තාක්ෂණික හා ශිල්පීය දැනුම ලබා දීමේ අවකාශය උදා විය් මෙම කණ්ඩායම් මගින් ලබා ගත් අධ්‍යාපනික පසුබිම මත දේශීය මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරගකාරී තත්වයක පවත්වාගෙන යාමට සමත් වනු ඇත.

<u>පුහුණු වැඩසටහන් සඳහා ලද ප්‍රගතිය</u>

,මොරගහකන්ද ,යාපනය ,පොළොන්නරුව ,බිංගිරිය ,මහනුවර ,ගාල්ල ,රත්නපුර ,වර්ෂයේදී මාලබේ 2016 09දී මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලාවන් සහ අවිස්සාවේල්ල යන මධ්‍යස්ථානරැසක් ක්‍රියාත්මක කරන ලදි .

<u>සංවර්ධන වැඩ සටහන්</u>

1. ක්ෂේත්‍ර යේ මුහුණ දී ඇති පුහුණු ශ්‍රමික හිගය පිටු දැකීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමග ඒකාබද්ධව විශේෂ පුහුණු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

2. අඩු ආදායම්ලාභීන්ගේ දැනුම කුසලතාවය වැඩි කර ක්ෂේත්‍ර යේ රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් පාඨමාලා නොමිළයේ හැදෑරීමට මාලබේ රත්නපුර ගාල්ල මහනුවර බිංගිරිය පොළොන්නරුව හා මොරගහකන්ද හා යාපනය ප්‍රදේශ ආවරණය වන පරිදි ආරම්භ කර පුහුණු පාඨමාලාවන් පවත්වා ගෙන යාමට නව මධ්‍යස්ථාන ක් ද ස්ථාපනය කර 03
3. ස්වර්ණාභරණ නිෂ්පාදනය ඩිප්ලෝමා (NVQ 05) විෂය නිර්දේශය සහ මැණික් කැපීම (NVQ 04)ජාතික වෘත්තීය නිපුණතා මට්ටම දක්වා පාඨමාලාවල විෂය නිර්දේශය සංවර්ධනය කරණු 4 .ලැබිණ

4. උසස් තාක්ෂණය සහිත පුහුණු ඒකක ස්ථාපනය කර විද්‍යානුකූලව සැකසූ ඉහල ප්‍රමිතියෙන් යුත් වාත්තු කිරීම හා විද්‍යුත් ලෝහාලේපන කිරීමේ පුහුණු ඒකකය ස්ථාපනය මැණික් කැටයම් කැපීම හා පබලු , ආභරණ නිෂ්පාදනය කිරීමේ පුහුණු ඒකකය ස්ථාපනයගල් බැදීම සඳහා නවීන නූතනයේ , පරිගණක ආශ්‍රිත ,යොදාගන්නා මයික්‍රෝ සෙටින් තාක්ෂණය සහිත පුහුණු ඒකකය ස්ථාපනය කිරීම .ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ පුහුණු ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත

5. පුහුණු කටයුතු ව්‍යාප්තිය සඳහා බාහිර ආයතන හා සම්බන්ධ වී එනම් කාර්මික විද්‍යාලයන්හී පුහුණු , පාඨමාලා පවත්වා ගෙන යාමට කාර්මික හා අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග ඒකාබද්ධවපුහුණු පාඨමාලා ආරම්භ කර ඇතජාතික මැණික් හා . ස්වර්ණාභරණ අධිකාරියමැණික් හා ස්වර්ණාභරණ සංගමය සමග ඒකාබද්ධවී මැණික් නිර්මාණ ,


6. ප්‍රගතිය පුහුණු පාඨමාලා -

7.1 පුහුණු ලාභීන් ලියාපදිංචිය - වර්ෂය 2016

| පුහුණු වැඩසටහන | | පුහුණු ලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රත්න විද්‍යාව | 97 |
| 02 | මූලික රත්න විද්‍යාව | 31 |
| 04 | ගෙවුඩ තාප පිරියම්කරණය | 96 |
| 05 | මැණික් කැපීම හා ඔප දැමීම | 213 |
| 06 | මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | 73 |
| 07 | මැණික් කැටයම් කැපීම | 12 |
| 08 | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 30 |
| 09 | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 63 |
| 10 | විලාසිතා ආභරණ නිෂ්පාදනය | 48 |
| 11 | ආභරණ සඳහා ගල් බැඳීම | 26 |
| 12 | පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය | 20 |
| 13 | රළු මැණික් හඳුනාගැනීම | 27 |
| 14 | මූලික මැණික් කැපුම් තාක්ෂණවේදය කෙටි )<br>(කාලීන | 21 |
| **එකතුව** | | **757** |

6.2 පසුගිය වර්ෂ පුහුණු පාඨමාලා සඳහා ලියාපදිංචි වූ පුහුණු ලාභීන් 05

| | පුහුණු වැඩසටහන | වසර 10තුල පුහුණු ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **2011** | **2012** | **2013** | **2014** | **2015** | **2016** |
| 01 | රත්න විද්‍යාව | 13 | 30 | 43 | 105 | 134 | 97 |
| 02 | මූලික රත්න විද්‍යාව | - | - | - | - | - | 31 |
| 04 | ගෙවුඩ තාප පිරියම්කරණය | 25 | 51 | 64 | 84 | 96 | 96 |
| 05 | මැණික් කැපීම හා ඔප දැමීම | 43 | 61 | 76 | 109 | 190 | 213 |
| 06 | මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | 72 | 48 | 118 | 175 | 157 | 73 |
| 07 | මැණික් කැටයම් කැපීම | - | - | - | - | - | 12 |
| 08 | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 30 | 16 | 44 | 18 | 37 | 30 |
| 09 | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 21 | 37 | 40 | 49 | 42 | 63 |
| 10 | විලාසිතා ආභරණ නිෂ්පාදනය | - | - | 21 | - | 18 | 48 |
| 11 | ආභරණ සඳහා ගල් බැඳීම | 8 | - | 9 | - | - | 26 |
| 12 | පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය | - | - | - | - | - | 20 |
| 13 | රළු මැණික් හඳුනාගැනීම | - | - | - | - | - | 27 |
| 14 | මූලික මැණික් කැපුම් තාක්ෂණවේදය කෙටි ) (කාලීන | - | - | - | - | - | 21 |
| එකතුව | | **212** | **243** | **415** | **540** | **674** | **757** |




## මානව සම්පත් සංවර්ධනය - 2016

| ආයතනය | | වැඩමුළුව / පාඨමාලාව | දිනය | සහභාගීත්වය |
|---|---|---|---|---|
| නිපුණතා සංවර්ධන අරමුදල | 1 | වැඩමුළුව "Professional Development of Management & Development Assistants" | 3/18/2016 | 1.ඩී.එච්.කේ.සී.එම්.කෞෂලයා මෙය.(MA)<br>2.ඩී.පී.ඒ.පී.කුලතුංග මෙය. (MA) |
| | 2 | වැඩමුළුව "Recruitment Procedure" | 2016-03-31 to 2016-04-01 | 1.ජේ.එම්.ගුරුසිංහ මෙය (AD) |
| | 3 | වැඩමුළුව "Motivation through right attitudes" | 4/27/2016 | 1.අයි.ඩී.එන්. ප්‍රියන්ජිකා මෙය (MA)<br>2.එච්.එල්.එස්.යූ.මදනායක මෙය (MA)<br>3.ජේ.පී.කේ.සංදීප් මයා (MA) |
| | 4 | වැඩමුළුව "Salary Convertions" | 2016-06-30 to 2016-07-01 | 1.පී.ඒ.කේ.එන්.පෙරේරා මිය (MA)<br>2.කේ.ඩී.ආර්.එස්.කුමාර මයා.(MA) |
| | 5 | වැඩමුළුව "Office management & Office procedures" | 2016-08-11 to 2016-08-12 | 1.පී.කේ.වික්‍රමආරච්චි මිය (MA)<br>2.එම්.පී.එන්.එම්.වික්‍රමසිංහ මිය (MA) |
| | 6 | වැඩමුළුව "Procurement & Evaluation of IT products" | 2016-08-30 to 2016-08-31 | 1.එම්.කේ.සී.ජයමාලි මෙය(RO)<br>2.එස්.ආර්.පී.සෙනෙවිරත්න මිය (IDO)<br>3.ජේ.පීකේ.සංදීප් මයා (MA) |
| | 7 | වැඩමුළුව "Effective managerial skills" | 2016-09-26 to 2016-09-27 | 1.ආර්.එම්.එන්.පී.කේ.ජයසිංහ මයා (Head-R)<br>2.එස්.එල්.ජේ.මුහන්දිරම් මයා (AD-F) |
| | 8 | වැඩමුළුව "Effective internal auditing" | 2016-10-13 to 2016-10-14 | 1.එච්.ඒ.එන්.ප්‍රියදර්ශනී මෙය(IA) |
| | 9 | වැඩමුළුව "Duties and responsibilities of office aids" | 2016-12-19 to 2016-12-20 | 1.ඊ.එච්.පතිරණ මිය (PL)<br>2.රුමේෂි රංගිකා මෙය (PL)<br>3.එස්.ඒ.එස්.නිදර්ශන මයා (PL)<br>4.ජී.ආර්.කේ.අයි.ජයරත්න මිය (PL)<br>5.කේ.ජී.එම්.අසංක මයා (PL) |
| කොළඹ විශ්ව විද්‍යාලය- Institute of Human Resource Advancement (IHRA) | 10 | වැඩමුළුව "Attitudes and Skills Development" | 6/10/2016 | 1.පී.ඒ.කේ.එන්.පෙරේරා මිය (MA)<br>2.එච්.එල්.එස්.යූ.මදනායක මයා(MA)<br>3.එච්.එල්.එල්.ජනිත්‍රි මෙය (MA) |
| ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 11 | වැඩමුළුව "Basic productivity programme" | 5/3/2016 | 1.ජේ.ඩී.එස්.රන්දිමාල් මයා(PL)<br>2.එස්.පී.ඩී.පී.කමලසිරි මයා(PL)<br>3.ඩබ්ලිව්.ඒ.එන්.එස්.කුමාර මයා (PL)<br>4.කේ.ජී.එම්.අසංක මයා (PL) |
| ජාතික ඉදිකිරීම් යන්ත්‍රෝප කරණ පුහුණු ආයතනය | 12 | වැඩමුළුව "Scientifical, Economical and Safety driving methods" | 9/6/2016 | 1.කේ.එම්.එස්.එම්.අබේසුන්දර මයා(Driver)<br>2.පී.එම්.චමින්ද මයා (Driver) |
| අනුකලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | 13 | වැඩමුළුව "Making accreditation mandatory in taking technical decisions" | 9/1/2016 | 1.එස්.වී.ටී.ඩී.රවීන්ද්‍ර සිංහ මයා(RO) |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | 14 | වැඩමුළුව "Sri Lanka public sector accounting standards (SLPSAS)" | 2016-08-11 to 2016-08-27 | 1.එස්.එල්.ජේ.මුහන්දිරම් මයා (AD-F) |

# <u>පර්යේෂණ ව්‍යාපෘති</u>

**ව්‍යාපෘති අංක 01: ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

මෙම ව්‍යාපෘති මොණරාගල දිස්ත්‍රික්කයේ ඌව පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන් හි ක්‍රියාත්මක වේ . )රූපය (01




***රූපය 1මොණරාගල දිස්ත්‍රික්කයේ අධ්‍යනය වෙමින් පවතින ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්***


සියඹලාණ්ඩුව ,මැදගම ,බිබිල,මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු 2016වසරේ දී අවසන් කරන ලදී .ඉන්පසු විද්‍යාගාර විශ්ලේෂණය ,භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදන විශ්ලේෂණ කටයුතු ,දත්ත විවරණ හා ඇස්තමේන්තු කිරීම ,දත්ත සමීක්ෂණය සහ මැණික් විභව සිතියම් හා සවිස්තරාත්මක වර්තා පිළියෙල කිරීම සිදුකෙරෙමින් පවතී .ඒ ඒ කොට්ඨාසයන් හි පර්යේෂණ කටයුතු වල ප්‍රගතිය පහත පරිදි වේ.

**1.1සියඹලාණ්ඩු හා මඩුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස**

2016වසර අවසන් වන විට ක්ෂේත්‍ර ගවේෂණය ,විද්‍යාගාර විශ්ලේෂණ ,භූ ගෝලිය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදන විශ්ලේෂණ කටයුතු,දත්ත විවරණ හා ඇස්තමේන්තුගත කිරීම හා දත්ත සමීක්ෂණ අවසන් කර ඇතග මෙම ප්‍ර දේශයන් හි මැණික් පවතින බවට විද්‍යාගාර විශ්ලේෂණවලින් ප්‍රමාණවත් සාක්ෂි හමුවී නැත .අර්ථික වශයෙන් ප්‍රතිලාභ ලබාදිය හැකි මට්ටමේ මැණික් නිධි වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ඉලක්කගත මෙම සමීක්ෂණයට අනුව මෙම ප්‍රදේශීයන්හි කිසිම ආකාරයක මැණික් විභවතා මට්ටමක් ඇති ප්‍රදේශ නොපවතී .අවසන් වාර්තාවේහි කෙටුම්පතක් මේ වන විට පිළියෙල කර ඇත.

## 1.2මැදගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස

මැදගමප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය ග්‍රාමනිලධාරී කොට්ඨාස 35කින් සහ ගම් 121කින් යුතු අතර එහි වර්ග ප්‍රමාණය කි.මී 121කින් යතු අතර එහි වර්ග ප්‍රමාණය වර්ග කි.මී 242.14කි.ගවේෂණයන් ගෙන් රැස්කරගත් තොරතුරු මූලික මැණික් විභව සිතියමට ඇතුළත් කළ අතර එ මගින් මැණික් විභවතාවය ඇති ප්‍රදේශ හඳුනා ගැනීම සිදුකරන ලදී 2016 .වන විට ග්‍රාමනිලධාරී කොට්ඨාස 10ක මැණික් විභව සිතියම පිළියෙල කර අවසන් කරන ලදී.





*රූපය - 02මැදගම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 10ක මැණික් විභවතා ප්‍රදේශ*

## 1.3බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මැණික් විභවතාව සවිස්තරාත්මකව සිතියම්ගත කිරීම සහ අත් විදුම් සම්පල ලබාගැනීම යන කටයුතු සම්බන්ධයෙන් ස්ථාන 374ක් දැනට අධ්‍යයනය කර අවසන් කර ඇත) .රූපය (03මේ මගින් ලබාගත් සාම්පල දැනට විද්‍යාගාර විශ්ලේෂණයට ලක් කෙරෙමින් පවතින අතර අවසන් වාර්තාව පිළියෙල කෙරෙමින් පවතී .

*රූපය 03මැණික් විභවතාවය අනුව වර්ගීකරණය කරන ලද අත්විදුම් සාම්පල ලබාගත් බිබිල ප්‍රාදේශිය*




*ලේකම් කොට්ඨාසයේ ස්ථානයන්*


**ව්‍යාපෘති 02අඩු අගයකින් යුත් මැණික්වල අගය ඉහළ නැංවීම**

## 2.1ශ්‍රී ලංකාවේ ගෙවුඩවල අගය වැඩි කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ තික් ගෙවුඩ වල වර්ණය හා පැහැදිලිතාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම මෙහි පළමු පියවර ලෙස ආරම්භ කර ඇත .පළමු තික් ගෙවුඩ සාම්පල් තොගය මිලදී ගැනුණ අතර ඒ වායේ පූර්ව තාප පිරියම්කරණ රසායනික විශ්ලේෂණය අවසන් කර ඇත.

## 2.2පුරාතන ශ්‍රී ලංකේය කැටයම් නිමැවුම් හා පබළුවල රත්න විද්‍යාත්මක විශ්ලේෂණය

මෙම කැටයම් නිමැවුම් හා පබළුවල විශිෂ්ට ගුරුත්වය මැනීම ,වර්තනාංකය මැනීම ,ෆූරියර් පරිණාමන අධෝරක්ත වර්ණාවලීක්ෂණය (Fourier Transform Infrared spectroscopy) ,එක්ස් කිරණ ප්‍රතිදීපන වර්ණාවලීක්ෂණය)x-ray fluorescence spectroscopy) යන ශිල්ප ක්‍රමයන් ආධාරයෙන් සිදුකරන ලදී . ලබාගන්නා ලද සංඛ්‍යාත්මක හා ප්‍රස්තාරික දත්ත මේ වන විට විශ්ලේෂණය කෙරෙමින් පවතින අතර ඒ මඟින් මෙම නිර්මාණයන් සාදා ඇති ඛනිජ ද්‍රව්‍ය හා ඒ සඳහා යොදාගන්නා ලදැයි උපකල්පිත තාක්ෂණවේදයන් නිරාවරණය කරගැරනීමට බලාපොරොත්තු වේ.




*රූපය 04**a)**පබළු**b),c)** සහ **d)** ගවයකු බ්‍රාහ්මී අක්ෂර හා නලඟනක් නිරූපිත කැටයම් නිමැවුම්*

## 2.3අඩු අගයෙන් යුතු පූනක්කං වල අගය වැඩි කිරීම.

මෙම ව්‍යාපෘතියෙදී පූනක්කං වලින් කැටයම් නිර්මාණය සඳහා අවශ්‍ය උසස් තත්වයේ අමුද්‍රව්‍ය , ලබා ගැනීමට යෙදිය යුතු උෂ්ණත්වයන් සහ ඔක්සීහරණ තත්වයන් හඳුනා ගන්නා ලදී .මෙහි අරමුණ වනුයේ ගෘහස්ථ මට්ටමේ කැටයම් කර්මාන්තය සඳහා අවශ්‍ය උසස් තත්තවයේ අමුද්‍රව්‍ය නිර්මාණය කිරීමයි.




රූපය 05කැටයම් ශිල්පය සඳහා යොදාගැනෙන පූනක්කංවල අගය වැඩි දියුණු කිරීම

## 2.4අඩු අගයෙන් යුතු ශ්‍රී ලංකේය ජාගුන්වල අගය වැඩිදියුණු කිරීම.

රළු සාම්පල ඒවායේ ස්ඵටික අක්ෂය ඔස්සේ තුනී පෙති 03කට කපා ඒ ඒ පෙතිවල උඩු සහ යටි පැති හොඳින් ඔප දමා ගන්නා ලදී)රූපය .(06ඔක්සීහරණ තත්ත්වයන් යටතේ තාප පිරියම් කිරීමෙන් පසු හටගත් වර්ණ විපර්යාසයන් රූපය 6න් දැක්වේ .කහ කොළ සිට කොළ වර්ණය දක්වා වර්ණ නිරීක්ෂණය වූයේ ඔක්සීහරණ තත්වයන් යටතේ පිරියම් කරන ලද මැණික් ගල් වලය .විශේෂයෙන්ම 900°C උෂ්ණත්වය හා ඔක්සිහරණ තත්ත්ව යටතේ පිරියම් කරන ලද මැණික් ගල් ප්‍රශස්තම වර්ණ වැඩිදියුණු වීම හා වඩා හොඳ පැහැදිලිබවක් පෙන්නුම් කරන ලදී.




*රූපය - 06තාපපිරියම් නොකළ ,අඩු අගයෙන් යුතු ජාගුන් නියැදි -වම්පස ,*
*ඔක්සිහරණය තත්ත්ව යටතේ පිරියම් කළ ජාගුන් නියැදි -මැද,*
*තාප පිරියම් කර කපා ඔප දැමූ ජාගුන් නියැදි -දකුණු පස*

මෙම සොයාගැනීම් මත පදනම් වූ ලිපියක් මේ වන විට *Journal of Gems and Gemmology*නම් සඟරාව වෙත ලබාදීම සඳහා සම්පාදිතය

## 2.5තාප පිරියම්කරණය මඟින් ශ්‍රී ලාංකේය ජාගුන් මැණික් වලට අගය එකතු කිරීම

ලක්මිණි උඳුන තුළ ප්‍රබල ඔක්සිහරණ තත්ත්ව හා 1100°C උෂ්ණත්වය යටතේ තාප පිරියම් කිරීම මඟින් රතු දුඹුරු ජාගුන් ලා නිල් පැහැයට හැරුණු අතර පැහැදිලි බවේ වෙනසක් සිදු නොවුණි.




*රූපය .07රතු දුඹුරු ජාගුන් ඔක්සිහරණ තත්ව හා 1100°Cඋෂ්ණත්වය යටතේ පිරියම් කිරීම මඟින් ලා නිල් වර්ණයට හැරීම.*

කොළ පැහැති ජාගුන් ලක්මිණි උඳුනෙහි ඔක්සිහරණ තත්ත්ව යටතේ 1750°C දක්වා තාපනය කළ විට ලා නිල් පැහැයට හැරෙන නමුත් එහි පැහැදිලි බවේ වෙනසක් සිදු නොවේ )රූපය .(08



*රූපය .08ඔක්සිහරණ තත්ත්ව යටතේ 1750°Cදක්වා තාපනය කළ කොළ පැහැති ජාගුන් වල වර්ණය ලා නිල් පැහැයට හැරීම.*

## ව්‍යාපෘතිය 03පෞද්ගලික ඉඩම් ආශ්‍රිතව මැණික් සම්පත් පැවතීම පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනය

මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණාත්මක හා සවිස්තරාත්මක තාක්ෂණික වාර්තා සැපයීම ,රාජ්‍ය හා පෞද්ගලික දේපළ තුළ ඇති නව මැණික් නිධි ඇතුළත් කර සකසන ලද සිතියම් මුද්‍රණය කිරීම ආදී කටයුතු සිදුකරනු ලැබේ .ඒ අනුව ,කපුගොඩ ,වග සහ ගොඩකවෙල යන ප්‍රදේශ වල)ඉඩම් හිමියන්ගේ ඉල්ලීම් අනුව ( මැණික් නිධි ගවේෂණ කටයුතු සිදුකළ අතර එම අධ්‍යයන වල තාක්ෂණික වාර්තා මේ වන විට නිකුත් කර අවසන්ය.
එම ඉඩම් හිමියන් වනුයේ,

- ඩබ්.ජී .ප්‍රේමරත්න 180 ,ගිරිදර ,කපුගොඩ
- ඩබ්.ඩී .පර්සිදයාසිරි ,134 ,නෙළුවත්තුඩුව ,වග
- ජී .එන්.පී.පෙරේරා ,නො,03 ඉස්තම්බුපෙදෙස ,කොළඹ03

## .4උසස් තාක්ෂණික සේවා

1. ආචාර්යජගත්පිටවල , ජ්‍යෙෂ්ඨකතිකාචාර්ය,විද්‍යාභාතාක්ෂණඅංශය ,ඌවවෙල්ලස්සවිශ්වවිද්‍යාලය - සාම්පල ,16XRF විශ්ලේෂණය,ලේසර්කිරණවිවර්තනයමඟින් අංශු වල ප්‍රමාණික විශ්ලේෂණය . .
2. මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ.පිටවල, භූ විද්‍යා අංශය,පේරාදෙණිය විශ්ව විද්‍යාලය, සාම්පල 13, XRF විශ්ලේෂණය

## .5වැඩමුළු

රත්නපුර පැවති ගෙවුඩ තාපකරණය පිළිබඳ වැඩමුළුව -NGJA ශ්‍රවණාගාරය

## .6ප්‍රදර්ශන

- **Exhibition Stalls at BMICH**
  - ✓ FACET – 2016.09.01, 02,03,04
  - ✓ NEXT – 2016.10. 17,18,19
  - ✓ JEWELS- 2016.12. 16,17,18

## .7අනෙකුත් අධ්‍යයන ආයතන සමඟ පැවැත්වූ සන්ධීය වැඩසටහන්

- පරිසර අධ්‍යානය පිළිබඳව නව විෂය නිර්දේශයට අනුකූලව පාසල් ගුරුභවතුන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය.
- ජාතිකවිද්‍යාපදනමමඟින්තාක්ෂණප්‍රදානයක්ලැබීම) .අංක TG/2016/Tech-D/
- CECB ආයතනයසමඟඇතිකරගත්විදුම්කරණගිවිසුම
- MINAMATAසම්මේලනයේක්‍රියාකාරීකමිටුසමාජිකයෙකුවීම.

## 8. වෙනත් ක්‍රියාකාරකම්

- අධිඋෂ්ණත්වවිදුලිඋඳුනපිළබඳසක්යතාඅධ්යනය
- ගෙවුඩතාපපිරියම්කරණයපිළිබඳපාඨමාලාවන්පැවැත්වීම) .මාළඹේභාරත්නපුර(
- රත්නපුරගෙවුඩකර්මාානතයේනියුතුවූවන්හටතාපපිරියම්කරණමධ්යස්ථානයක්විවෘතකිරීම.
  - ❖ ගෙවුඩකර්මාන්තයේනියුතුවූවන්හටතාපපිරියම්කරණසේවාලබාදීමසඳහා

## 9. ප්‍රකාශන

ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණ හා තක්සේරුව සහ අඩු වටිනාකමින් යතු මැණික් වල අගය වැඩිකිරීමේ ක්‍රමවේද යන ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ලිපි ගණනාවක් දේශීයව හා අන්තර්ජාතික සඟරාවල මේවන විට පළකර ඇත.එයට අමතරව 2016 වර්ෂයේ අග භාගයේදී ග්‍රන්ථ දෙකක් ප්‍රකාශය කරන ලදී.

1. R.M.N.P.K. Jayasinghe, M.K.C. Jayamali, S. Wijewardane, G.G.M.S.Wickramasinghe and R.M.S. Dharmasiri, ‘Value addition of Sri Lankan Gemstones.’, ISBN 978-955-8382-02-8.

2. ආර්.එම්.එන්.පී.කේ .ජයසිංහ,එම්.කේ.සී ජයමාලි ,එස් .විජේවර්ධන,ජී.ජී.එම්.එස් .වික්‍රමසිංහ සහ ආර්.එම්.එස් .ධර්මසිරි. **“ ශ්‍රී ලංකාවේ මැණික්වල අගය ඉහල නැංවීමේ තාක්ෂණය”** ISBN 978-955-8382-03-5**.**

3. W.M.M.P.E. Bandara, M.K.C. Jayamali, J. Gunatilaka and P. Francis, ‘Applications of Spatial and Statistical Methods for Gem Potential Mapping- A case study from Moneragala District- Sri Lanka(Abs.).’, Proceedings of the PGIS Research Congress Symposium 2016 of the Post Graduate Institute of Science, University ofPeradeniya, Sri Lanka, 2016, Paper ID 132.

4. M.K.C. Jayamali, W.M.M.P.E. Bandara, J.Gunatilaka, P. Francis, R.M.N.P.K.Jayasinghe and R.M.S. Dharmasiri,‘Gem potential mapping based on Geographical Information Systems (GIS): A case study from Medagama, Moneragala district, Sri Lanka’. Journal of Geological Society of Sri Lanka Vol. 18 (2016- manuscript accepted).

5. S.V.T.D. Raveendrasinghe, ‘Occurrence of Andalusite and ChiastoliteInBalanthota – Ginigathhena Sri Lanka (Abs.). Proceedings of the 32nd Technical Session of Geological Society of Sri Lanka (GSSL): 8.

6. W.G.C.N.Wewegedara,Prashan Francis ‘Value addition of Sri Lankan gem zircon via heat treatment’ (Abs.). Proceedings of the Sri Lanka NEXT – A Blue – Green EraConference and Exhibition,2016: 7,8.

7. **ශෂිකලා ධර්මසිරි ,මැණික් පතල් කැණීම් කර්මාන්තය හා බැඳුණු පාරිසරික බලපෑම් ,හෙළමිණි වරුණ 3 ,වන කලාපය 2016)ඔක්තෝබර් ,(මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.**

8. **එස්.විජේවර්ධන ,නුවරඑළිය අඹගමුව කෝරළයට අනවසර මැණික් කැණීමෙන් සිදුව ඇති පාරිසරික හානිය,හෙළමිණි වරුණ 3 ,වන කලාපය 2016)ඔක්තෝබර් ,(මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.**

9. **ඩබ්.ජී.සී.එන්.වැවේගෙදර ,මැණික් පාෂාණ හඳුනාගනිමු ,හෙළමිණි වරුණ 3 ,වන කලාපය 2016) ඔක්තෝබර් ,(මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.**

10. **එම්.කේ.සී.ජයමාලි ,මැණික් කර්මාන්තය හා බැඳුණු පතල්කරුවන්ගේ ජීවිකාව ,හෙළමිණි වරුණ 3 , වන කලාපය 2016)ඔක්තෝබර් ,(මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.**

11. R.M.T.D.Madusanka,D.T. Jayawardana and R.M.N.P.K. Jayasinghe, Fourier Transformation Infrared (FTIR) Spectroscope Analysis of Soil Organic Matter in an alluvial Type Gem Deposits in Pelmadulla, Sri Lanka. (Abs.), Proceedings of the 21stInternational Forestry and EnvironmentSymposium 2016, Paper ID 236.

තවද ආයතනයේ ප්‍රගතිය තකා පර්යේෂණ අංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි .එහිදී පර්යේෂණ අංශයේ නිලධාරීන් විසින් ආයතනයේ අනිකුත් ක්‍රියාකාරකම් වලදී දක්වන සහයෝගය සඳහන් කළ යුතුය,

**.1ප්‍රසම්පාදන කටයුතු**

- පර්යේෂණහාකාර්යාලීයභාණ්ඩමිලදීගැනීමසඳහාපිරිවිතරලේඛනසකස්කිරීම
- ලංසුකැඳවීමහාඅවශ්‍යයලියකියවිලිසම්පාදනය.
- තාක්ෂණිකඇගයීම්වාර්තාසකස්කිරීම.
- ස්ථාවරවත්කම්හාතොගසම්පාදනකටයුතුහාඑමස්පීරකළභාණ්ඩවිකිණීමහාඉවත්කිරීමේකටයුතු.

**.2ප්‍රදර්ශනාගාර කටයුතු**

- පර්යේෂණනිලධාරීන්සැමවිටමප්‍රදර්ශනකුටිහැසිරවීමේදිප්‍රධානකාර්යභාරයක්ඉටුකරයි
  (උදා:- හාලිඇළමධ්‍ය මහා විද්‍යාලය,වවුනියාවමධ්‍ය මහා විද්‍යාලයපැවතිප්‍රදර්ශනාගාරහැසිරවීම්කටයුතු)
- නවබඳවාගැනීම්සඳහාවිභාගප්‍රශ්ණ පත්‍රසැකසීමහාවිභාගනිරීක්ෂණකටයුතු.

**විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය**

**පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු**

| | **2012** | **2013** | **2014** | **2015** | **2016** |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන | 29,629 | 32,113 | 43,35 7.0 | 47,081.0 | 58627.0 |
| වෙනත් දායක වීම් | 13,853 | 13,020 | 13,862.9 | 26,447.4 | 33,522.7 |
| පාඨමාලා ගාස්තු | 5,228 | 3,949 | 6,941 | 6,408.5 | 9,445.4 |
| සේවා ගාස්තු ආදායම් | 30 | 15 | | | 50.3 |
| භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම් | | | | | |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **48,740** | **49,097** | **64,161** | **79,936.9** | **101,645.4** |
| වෙනත් ආදායම් | 223 | 38 | 303 | 625.8 | |
| පොලි ආදායම | 309 | 406 | 309 | 248.2 | 342.6 |
| වෙනත් ලැබීම් | 140 | 54 | | 49.5 | 837.0 |
| **මුළු ආදායම** | **49,412** | **49,595** | **64,773** | **80,860.4** | **102,825** |
| අඩුකලා - වියදම් | | | | | |
| ඒ සේවක හා පරිපාලන වියදම් | 35,403 | 37,260 | 44,558 | 57,081.4 | 68,431.9 |
| බී ක්ෂය සහ පොදු වියදම් | 14,217 | 13,452 | 17,572 | 31,260.6 | 27,805.3 |
| **මුළු වියදම්** | **49,619** | **50,712** | **62,130** | **88,342** | **96,237.2** |
| **අතිරික්තය (ඌණතාවය)** | **(207)** | **(1117)** | **2,643** | **7,481.6** | **6,587.8** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය**

| විස්තරය | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | රු..000 | රු..000 | රු..000 | රු..000 |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර | | 58,627.0 | | 47,081.0 |
| **වෙනත් ආදායම්** | | | | |
| පාඨමාලා ගාස්තු | | 9,445.4 | | 6,408.5 |
| ගෙවුඩ තාපකරණ ගාස්තු | | 50.3 | | |
| භූ විද්‍යා පර්යේෂණ සේවා | | | | |
| පොලී ආදායම් | | 342.6 | | 248.2 |
| විවිධ ආදායම් | | 837.0 | | 625.8 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | | **69,302.2** | | **54,363.5** |
| **අඩු කළා : මෙහෙයුම් වියදම්** | | | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 35,477.3 | | 31,356.7 |
| ගමන් වියදම් | | 316.7 | | 510.6 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | | 2983.4 | | 1382.8 |
| නඩත්තු වියදම් | | 4054.7 | | 4600.4 |
| ගිවිසුම් ගත සේවා | | 18,428.8 | | 16,293.6 |
| පුහුණු වියදම් | | 6345.8 | | 2452.8 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 825.2 | | 458.6 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | | | **57,055.5** |
| **මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)** | | **870.3** | | **(2692)** |
| අඩු කළා - මූල්‍ය පිරිවැය | | (35.9) | | (25.9) |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන | 26,131.5 | | 21,027.0 | |
| වෙනත් ලැබීම් | | | | |
| | 26,231.5 | | 21,027.0 | |
| අඩු කළා - ක්ෂය කපා හැරීමේ වියදම් | (20,378.2) | | (25,840.2) | (4813.20) |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන | 7391.2 | | 5420.4 | |
| අඩු කළා - ප්‍රාග්ධන ආයෝජන වියදම් | (6064.9) | | (4800.9) | |
| ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම් | (1326.3) | | (619.5) | |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම | | | | |
| මෙහෙයුම් නොවන ආදායම් | | **5717.5** | | **(4839.10)** |
| **එකතු කලා වත්කම් විකිණීමෙන් ලද ආදායම** | | | | 49.5 |
| **අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතවය)** | | 6587.8 | | (7481.60) |
| අති විශේෂ අයිතම | | | | |
| **කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය** | | 6587.8 | | (7481.60) |
| එකතු කලා පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | (70,086.70) | | (61,463.97) | |
| අඩු කළා - පෙර වර්ෂ ගැලපීම් | | 21,522.3 | | (1141.1) |
| ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | | **(41,976.6)** | | **(70,086.70)** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ**
**2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| **විස්තරය** | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල යන්ත්‍ර උපකරණ | 124,814 | | 53,110 | |
| පාරිතෝෂික අරමුදල | 502 | 125,315 | 252 | 53,362 |
| **විලම්භිත වියදම්** | | | | |
| නවීකරණ සහ වෙන් කිරීමේ වියදම් | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 2313 | | 833 | |
| අඩු කළා: ලියා හැරීම් සඳහා වෙන් කිරීම් | | | (648) | |
| | 2313 | | 186 | |
| විකිණීම සඳහා ඇති පොත් | 2 | | 24 | |
| ණය හා අත්තිකාරම් | 2631 | | 1984 | |
| බැංකු තැන්පතු ගිණුම් (කෙටිකාලීන) | 4095 | | 3805 | |
| තැන්පතු | 2810 | | 2700 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 2088 | | 615 | |
| පෙර ගෙවීම් | 496 | | 198 | |
| මුදල් හා බැංකු | 839 | 15,274 | 29,697 | 39,210 |
| **වත්කම් එකතුව** | | 140,589 | | 92,573 |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 408 | | 358 | |
| උපචිත වියදම් | 2147 | | 4083 | |
| ණය හිමියෝ | | | 119 | |
| උපයන විට ගෙවීම් බදු | | | 4 | |
| ගෙවිය යුතු ගමන් වියදම් | | | | |
| ගෙවිය යුතු- පාරිතෝෂික ජංගම ගිණුම් | | 2555 | 373 | 4937 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පාලන ගිණුම් (ජා. මැ. ස්. අධිකාරිය) | 3,179 | | 3,179 | |
| ප්‍රදාන-(වෙනත් ආයතන) | 232 | | 232 | |
| පරිතෝෂික සඳහා වෙන්කිරීම් | 10,110 | | 9,211 | |
| සේවක ආරක්ෂක තැන්පතු | 10 | | 10 | |
| වන්දි ගෙවීම් | | 13,531 | 231 | 12,863 |
| **වගකීම් එකතුව** | | 16,086 | | 17,801 |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **124,503** | | **74,772** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | | | |
| සහභාගිත්ව ප්‍රාග්ධනය | 50,000 | | | 50,000 |
| සංචිත | | | | 4500 |
| වෙනත් දායක වීම් | 850 | | | 850 |
| සේවක වක්‍රිය අරමුදල | 978 | | | 882 |
| විලම්භිත ආදායම් රැ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 114,652 | | | 88,626 |
| සමුච්චිත අරමුදල | (41,977) | | | (70,087) |
| **ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව** | | **124,503** | | **74,772** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය**

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | **2016** | **2015** |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත (ඌනතාව) | 6,587.8 | (7,531.1) |
| **මුදල් නොවන ගනුදෙනු** | | |
| ක්ෂය වෙන්කිරීම | 20,378.2 | 25,840.2 |
| ප්‍රාග්ධන වියදම් කපාහැරීම් | 7,391.18 | 5,420.4 |
| විලම්භිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම් | (33,522.7) | (26,447.4) |
| පෙර වර්ෂයේ ගැලපීම් | 6,926.6 | (2,717.9) |
| ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | (2,381.7) | 2,213.0 |
| අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම/අඩුවීම | 667.6 | |
| සේවක පිරිවැය සඳහා ප්‍රතිපාදන වල වැඩි වීම | | (697.0) |
| අනෙකුත් ජංගම වත්කම් වල වැඩි වීම | (4.922.6) | (1,249.0) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)** | **1,123.7** | **(2,450.9)** |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | (77,485.4) | (11,340.0) |
| පාරිතෝෂික අරමුදලේ වැඩිවීම | (249.7) | 1,611.0 |
| ආයෝජන විකිණීම් වලින් ලැබීම් | 96.0 | 48.0 |
| සංචිත වල වැඩිවීම | (4,500) | (5420.4]) |
| ස්ථාවර වත්කම් විකිණීම | (7,391.2) | 1128.0 |
| **ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)** | **(89,530.3)** | **(13,973.40)** |
| **මුල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | 59,548.5 | 29,826.2 |
| රජයට විශේෂ අය වීම් | | |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)** | **59,548.5** | **29,826.2** |
| මුදල් හා මුල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ) | (28,858) | 13,402.0 |
| ආරම්භක මුදල් /මුල්‍ය ශේෂය | 29,697 | 16,295.0 |
| **වර්ෂය අවසානයේ මුදල් / මුල්‍ය ශේෂය** | **839** | **29,697.0** |